# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 67 — 1973 ජූලි 06 වැනි සිකුරාදා — 1973.07.06

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 647 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 651 |
| සභාපති—ඇබෑර්තු ... ... ... | — | අය-වැය ලේඛන ... ... ... | 655 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 650 | දේපල විකිණීම් ... ... ... | — |
| අනුරු වාවස්ථා ... ... ... | 650 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... | 658 |


**සැලකිය යුතුයි.**—මහ නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ජූනි 29 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

## පළාත් පාලන නිවේදන

### නානායම් පනත

(257 වැනි අධිකාරය වන) නානායම් පනතේ 3 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති වරයා විසින් පනවන ලද නියෝගය.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1973 ජූනි 27,
කොළඹ දී ය.

#### නියෝගය

යාපනය නානායමෙහි පාලනය යාපනය ප්‍රදේශයේ සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත පවරමින්, 1968. 12. 29 දින අංක 14,834/2 දරන ගැසට් පත්‍රයෙහි 1968. 12. 28 වැනි දිනෙන් යුතුව පළ කරන ලද නියෝගය 1973. 07. 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිච්ඡින්න කරනු ලැබේ.

7-207—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

එල්ජීඩී/එච්සී/7/6/4/9

### ගම්සභා ආඥාපනත

#### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, එකී වගන්තියේ (1) වැනි උප වගන්තිය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එගොඩපත්තු ගම්සභාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1973 ජූනි 13 දින,
කොළඹ දීය.

7-189 —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1973 ජනවාරි මස 7 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

## කඩුවෙල ගම්සභාව

### ප්‍රසිද්ධ රහදක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරිය වන) ප්‍රසිද්ධ රහ දක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ රීතිය.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1973 ජූනි මස 8 වැනි දින,
කොළඹ දී ය.

### රීතිය

(176 වැනි අධිකාරිය වන) ප්‍රසිද්ධ රහ දක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ සාද, 1919 අප්‍රේල් මස 4 වැනි දින අංක 7,004 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1943.04.09 වැනි දින අංක 9,108 දරණ ගැසට් පත්‍රයේ පළවූ රීතියෙන් අවසාන වරට සංශෝධනය කරන ලද රීති, කඩුවෙල ගම්සභාවේ පාලන සීමාවන් ඇතුළත වූ ප්‍රදේශයට අදළ වන පමණට, එහි අංක 3 දරණ රීතියෙන් දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් වෙනුවට පහත සඳහන් නව ගාස්තු ප්‍රමාණයන් ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| | එක් දිනකට | එක් මසකට | හය මසකට | වර්ෂයකට (දෙසැම්බර් 31) වැනි දිනයෙන් අවසන් වන) |
|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ආසන පහසුකම් සලස්වනු ලැබ ඇති පුද්ගලයන්ගේ ගණන 199 ට වැඩි නොවන විට ... | 10 0 ... | 30 0 ... | 125 0 ... | 175 0 |
| ආසන පහසුකම් සලස්වනු ලැබ ඇති පුද්ගලයන්ගේ ගණන 199 කට වැඩි නමුත් 399 ට වැඩි නොවන විට ... ... ... ... | 15 0 ... | 50 0 ... | 200 0 ... | 250 0 |
| ආසන පහසුකම් සලස්වනු ලැබ ඇති පුද්ගලයින්ගේ ගණන 399 ට වැඩි වන විට ... | 20 0 ... | 60 0 ... | 300 0 ... | 400 0 |

7-66—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 22/53.

### විදුලි බල පනත

වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමතිතුමාගෙන් විමසා රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් දෙන ලද අනුමැතිය ඇතිව චුන්නාකම් සුළු නගර සභාව විසින් 1957 අංක 59 දරණ පනතින් සංශෝධිත (205 වන අධිකාරය වන) විදුලි බල ආඥාපනතේ 46 වැනි වගන්තිය යටතේ සම්පාදිතවූ නියෝග.

ජී. බී. වික්‍රමණායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 6. 21 වැනි දින,
කොළඹ දීය.

#### නියෝග

1. මේ නියෝගවල—

"පනත" යනුවෙන් 1957 අංක 59 දරන පනතින් සංශෝධිත (205 වැනි අධිකාරය වන) විදුලි බල පනත අදහස් කරනු ලැබේ.

"බලපත්‍රය" යනුවෙන් පනතේ 2 වැනි වගන්තිය යටතේ චුන්නාකම් සුළු නගර සභාව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කරනු ලැබේ.

"බලපත්‍රලාභියා" යනුවෙන් චුන්නාකම් සුළු නගර සභාව අදහස් කරනු ලැබේ.

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රලාභියාගෙන් විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තු වන යම් කෙනකු විසින්—

(අ) විදුලි බලය ලබා ගැනීමට ඕනෑ කරන දින සිට යටත් පිරිසෙයින් දවස් දහ හතරකට මත්තෙන් ඒ සඳහා බලපත්‍රලාභියා විසින් සපයනු ලබන ආකෘතිපත්‍රයෙහි පිළියෙල කළ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය; තවද

(ආ) විද්‍යුත් වේගවාහක කේබල් කම්බිය සඳහා ගාස්තු බලධාරියා වෙත කලින් ගෙවීම, හෝ බලපත්‍රලාභියා එසේ නියම කරන්නේ නම් ආඥාපනතේ 33 වැනි වගන්තිය යටතේ බලපත්‍රලාභියා සමඟ ලිඛිත ගිවිසුමකට ඇතුළත්වීම කළ යුතුය.

3. (අ) බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහන ප්‍රධාන කම්බියට සම්බන්ධ කිරීමට අදහස් කෙරෙන විදුලි බල සංස්ථාපනයක කම්බි ඇදීම පාරිභෝගිකයා විසින් කම්බි ඇදීම පිළිබඳව ඉංජිනේරු ආයතනය විසින් නියම කරනු ලැබූ නියෝග වලට අනුව කටයුතු කළ හැකි සෑම සමාගමකට හෝ පුද්ගලයකුට පැවරිය යුතුය. බලපත්‍රලාභියා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් ඒ කර්මාන්තය පරීක්ෂා කොට අත්හදා බැලීමෙන් හා කම්බි ඇදීම පිළිබඳ ඉහත කී නියෝග අනුව ඒ කර්මාන්තය නිම කර ඇත්තේ යයි බලපත්‍රලාභියා සෑහීමට පත්වූවාට පසු පමණක් එබඳු සංස්ථාපනයකට විදුලි බලය සැපයිය හැකිය.

(ආ) සංස්ථාපනය එකී නියෝග වලට අනුකූල නොවන්නේ නම්, ඒ සංස්ථාපනය ඒ නියෝගවලට අනුකූලව සකස් කරනු ලබන තුරු ඒ ස්ථානයට විදුලි බලය නොදිය යුතුය.

4. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභෝගිකයකු විසින් ම බලපත්‍රයේ සඳහන් කරන ලද ප්‍රමාණ අනුව ඒ විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතු ය.

5. (අ) පාරිභෝගිකයාට අයත් භූමියෙහි පිහිටුවා තිබෙන විද්‍යුත් වේගවාහක කම්බියේ කොටස, විදුලි බල පරිවර්තක, ප්‍රධාන ගිනි නූල්, විද්‍යුත් මාපකය සහ විදුලි යතුරු පුවරු ද බලපත්‍රධාරියා සතු දේපළ වශයෙන් පැවතිය යුතු අතර, බලපත්‍ර ලාභියාගේ බලය පවරනු ලැබූ සේවකයකු විසින් හැර වෙන යම් කෙනෙකු විසින් මොනම කාරණයක් සඳහාවත් ඒවා වෙනස් කිරීම හෝ අතපත ගෑම හෝ නොකළ යුතුය.

(ආ) බලපත්‍රලාභියාගේ ප්‍රධාන ගිනි නූලේ හෝ මීටරයේ සිට ස්වකීය පාර්ශ්වයේ ඇත්තාවූ කම්බි, කේබල් කම්බි හා උපකරණ නඩත්තු කිරීම ගැන පාරිභෝගිකයා විසින් වගකිව යුතුය.

(ඇ) ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කරන ලද විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීමේදී එය සෝදිසි කර බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයෙහි විධි විධාන සලසා ඇති පරිදි උචිත ගාස්තුවක් අය කළ යුතු අතර පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

(ඈ) යම් පාරිභෝගිකයකුගේ විදුලි කම්බිවල හෝ උපකරණ වල යම් කොටසකින් විදුලි බලය කාන්දුවීමක් සිදු වුවහොත් ස්වකීය ස්ථානයේ පාවිච්චි වූ ලෙස මාපකයේ සටහන්වූ සියලුම විදුලි බලය සඳහා පාරිභෝගිකයා විසින් විදුලිබල පනතේ 41 වන වගන්තියට අනුව මුදල් ගෙවීමට බැඳී සිටිය යුතුය.

6. (අ) තමාට විදුලි බලය සැපයුවාට පසු යම් වීටෙක තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් යම් ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චි කරන මෝටරයට වඩා විශාල වූ මෝටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම් ලාම්පුවක් හෝ විදුලි බලය පාවිච්චි වන වෙනයම් උපකරණයක් සවි කිරීමට තමාගේ දේපොලෙහි ඇද තිබෙන විදුලි කම්බි කොයි අන්දමකින් නමුත් වෙනස් කිරීමට හෝ දික් කිරීමට හෝ අදහස් කරන සෑම පාරිභෝගිකයෙකු විසින් ම, එබඳු දික් කිරීමක් හෝ වෙනස් කිරීමක් පිළිබඳ කටයුතු ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් මත්තෙන් එබඳු යම් වෙනස් කිරීමක් හෝ දික් කිරීමක් පිළිබඳව බලපත්‍රලාභියා වෙත දැනුම් දිය යුතුය.

(ආ) කිසිම පාරිභෝගිකයකු විසින් තාවකාලිකව හෝ ස්ථිර වශයෙන්, යම් දීර්ඝ කිරීමක්, ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චි කරන මෝටරයකට වඩා විශාල වූ මෝටරයක් පාවිච්චි කිරීම

හෝ වැඩිපුර යම්කිසි හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන උපකරණයක් විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සවි කිරීම, ඒ දීර්ඝ කිරීම, ලාම්පු, පංකාව, මෝටරය, වැඩිපුර ලාම්පු හෝ වෙනත් උපකරණ බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධාරියකු විසින් පරීක්ෂා කොට අත්හදා බලා සතුටුදායක යයි ඒත්තු ගතහොත් මිස, සවි නොකළ යුතුය.

7. (අ) යම් ස්ථානයක බලපත්‍රලාභියාගේ ගිනිනූල උණුවී ගිය හොත්, පාරිභෝගිකයා විසින්, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියාගේ විදුලි බලස්ථානය හෝ උප බලස්ථානය භාර නිලධාරියා වෙත ඒ බව වහාම දැනුම් දිය යුතුය.

(ආ) බලධාරියා විසින් බලය දෙන ලද නිලධරයකුගෙන් හෝ බලපත්‍රලාභියා විසින් සේවයෙහි යොදවා සිටින කම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින් බලපත්‍රලාභියාගේ දේපළ වන උණුවී ගිය ගිනි නූල වෙනුවට වෙනින් ගිනිනූලක් දැමීම නොකළ යුතුය.

(ඉ) පාරිභෝගිකයාගේ හෝ බලපත්‍රලාභියාගේ හෝ දේපළ වන යම් ගිනි නූලක් වෙනුවට වෙනකක් දැමීමට බලපත්‍රලාභියාගේ යම් නිලධරයකුගේ හෝ කම්කරුවකුගේ හෝ සේවය වුවමනා කරන්නේ නම්, ඒ සඳහා ගෙවිය යුතු බලපත්‍රයේ සඳහන් උචිත ගාස්තුව පාරිභෝගිකයාගේ ඒ මාසයේ ගණනට ඇතුළත් කළ යුතුය.

8. විදුලිබලය සැපයීමේදී සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ සිදුවන බාධා හේතුකොට ගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ සිදුවන පාඩුවක් හෝ අලාභහානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා පාරිභෝගිකයාට වග කීමට බැඳී නොසිටී.

9. ආඥාපනතේ 45 වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කොට තිබුණා වූ විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කරන කල්හි එය අත්හදා බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් ගාස්තුවක් අය කළ යුතුවාත් හැර, එය පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

10. (අ) සියලුම අය කිරීම්, ගණනක් ඉදිරිපත් කරනු ලැබූ දිනයට අය විය යුතුව තිබෙන්නාසේ සැලකිය යුතුය.

(ආ) යම් ගණනක් වෙත ඉදිරිපත් කොට සතියක් ඇතුළත දී කරන ලද්දේ නම් මිස ගණනක හරි වැරදි පිළිබඳ වූ කිසිම පැමිණිල්ලක් බලපත්‍රලාභියා විසින් භාර නොගත යුතුය.

11. (අ) ස්වකීය ස්ථානයට විදුලි බලය අනවශ්‍ය සෑම පාරිභෝගිකයකු විසින්ම ඒ බව තුන් දවසකට කලින් බලපත්‍රලාභියා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

(ආ) (අ) ඡේදයේ සඳහන් දැනුම් දීම කර නොමැති කල්හි, විදුලි බලය අනවශ්‍ය බව දන්වමින් බලපත්‍රලාභියා දැන්වීම් ලබන දින සිට දවස් තුනක් ගතවනතුරු ඒ ස්ථානයේ බලපත්‍රලාභියාගේ උපකරණ සම්බන්ධයෙන් පාරිභෝගිකයා වගකිව යුතු අතර, ඒ ස්ථානයේ පාවිච්චි කරන්ට යෙදුන සියලුම විදුලි බලය සම්බන්ධයෙන් ගාස්තු ගෙවීමටද පාරිභෝගිකයා යටත් වියයුතුය. එසේ වුවද එකී දවස් තුන අවසාන වන්නට මත්තෙන් බලපත්‍රලාභියා විසින් සේවය අසම්බන්ධ කරන ලද්දේ නම්, සේවය අසම්බන්ධ කරනු ලබන තාක් ඒ ස්ථානයේ පාවිච්චි වන විදුලි බලය සම්බන්ධයෙන් පමණක් ගාස්තු ගෙවීමට පාරිභෝගිකයා යටතේ වියයුතු ය.

12. යෝජිත කර්මාන්තය බලපත්‍රලාභියාගේ නිලධරයකු විසින් පරීක්ෂා කර බැලීමට හැකි වන පරිදි ඒ පිළිබඳ දවස් දෙකකට නොඅඩු දින ගණනකට කලින් දැනුම් දීමෙන් පසුව මිස, දැනට පවත්නා විදුලි බල සංස්ථාපනයක එක් කිරීම්, වෙනස් කිරීම් හෝ සකස් කිරීම් ඇතුළුව විදුලිබල සංස්ථාපන කර්මාන්ත වැනි කිසිදු විදුලි කර්මාන්තයක් ආරම්භ නොකළ යුතුය.

13. බලපත්‍රලාභියා වෙත දැන්වීමක් නොකරනු ලැබ හා ඔහුගේ අනුමැතිය කලින් ලබා නොගෙන යම් ස්ථානයක අලුත් විදුලි බල සංස්ථාපනයක් සම්බන්ධයෙන් වූ යම් විදුලි කර්මාන්තයක් කරගෙන යන්නේ නම්, බලපත්‍රලාභියා වෙත විධිමත් දැනුම්දීමක් ලැබෙනතුරු හා අවශ්‍ය අත්හදා බැලීම් කරන තුරු බලපත්‍රලාභියා විසින් එකී විදුලි කර්මාන්තය කරගෙන යන ලද ස්ථානයට විදුලි බලය සැපයීම ප්‍රතික්ෂේප කරත හැකිය.

14. බලපත්‍රලාභියාට කලින් දැන්වීමක් නොකර හා ඔහුගේ අවසරය ලබා නොගෙන බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සවිකර ඇත්තා වූ විදුලි බල සංස්ථාපනයක යම් දීර්ඝ කිරීමක් කරගෙන යනු ලබන විට සම්පූර්ණ විදුලි බල සංස්ථාපනයට සවි කිරීම බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියෙන් අසම්බන්ධ කරනු ලැබීමට යටත් විය යුතු ය.

15. යම් විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම බලපත්‍රලාභියා විසින් ඒ සඳහා සපයනු ලැබිය හැකි ආකෘති පත්‍රයක ඉදිරිපත් කළ යුතු අතර, විදුලි බලය අවශ්‍ය වන්නට පැය හතලිස් අටකට නොඅඩු කාලයකට ප්‍රථම එය බලපත්‍රලාභියාගේ කාර්යාලය වෙත භාර දිය යුතු ය.

7–65—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13(1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, මහනුවර දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස්, මුතුබණ්ඩාර සමරකෝන් වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ උ. දු. ගම්පහ නැගෙනහිර ගම්සභාවේ අංක 9 දරණ කොට්ඨාශයේ සභික, කම්මැලේ ගෙදර සුන්දරා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමට පත්ව, මහනුවර දිස්ත්‍රික්කයේ උ. දු. ගම්පහ නැගෙනහිර ගම්සභාවේ අංක 9 දරණ කොට්ඨාශයේ සභික කම්මැලේ ගෙදර සුන්දරා මහතා, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට සාමාජිකත්වය අත් හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඇම්. බී. සමරකෝන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මහනුවර දිස්ත්‍රික්කය.

1973 ජූනි මස 22 දින,
මහනුවර, පළාත් පාලන කාර්යාලයේ දීය.

7-162 —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වෙනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරන පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 අධිකාරය) 13 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ගන්හේවාගේ දයානන්ද ද සිල්වා වන මම, පල්ලෙවෙල ගම්සභාවේ අංක 11 දරණ කොට්ඨාශයේ අතාවුද අච්චිගේ විජේරත්න මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් තුනකට වැඩි ගණනකට තමා තෝරා පත්කර ගැණීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලෙවෙල ගම්සභාවේ අංක 11 දරණ කොටයේ නියෝජිත අතාවුද අච්චිගේ විජේරත්න මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දිනයේ සිට සිය ධුරය හිස් කර ඇති බව මෙයින් ප්‍රකාශ කරමි.

ග. දයානන්ද ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කොළඹ දිසාව.

1973 ජූනි මස 25 දින,
කොළඹ දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

7–59—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ කිරම මිද්දෙණිය සහ වීරකැටිය යන ගම්සභාවන්ගේ ඒකාබද්ධ ප්‍රදේශ නැවත ප්‍රතිසංස්ථාපනය කිරීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරවා පත්තුවේ, කිරම, මිද්දෙණිය සහ වීරකැටිය යන ගම්සභාවන්ගේ ඒකාබද්ධ ප්‍රදේශය පරිපාලනමය කටයුතු තවදුරටත් පහසු වන අන්දමින් නැවත බෙදා නව ගම්සභා වශයෙන් සංස්ථාපනය කළ යුතුද ? එසේ සංස්ථාපණය කළ යුතු නව ගම්සභා මොනාවාද ? යන්න ගැන සොයා බලා අවශ්‍ය නිර්දේශයන් ඉදිරිපත් කරණු පිණිස,

(1) හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් එච්. ජී. ආනන්ද මහතා (සභාපති),

(2) වීරකැටිය ප්‍රාදේශීය උප දිසාපති ආරියදාස වීජේතුංග මහතා, සහ

(3) මැණුම් කණ්ඩායම් භාර නිලධාරි, වී. අරඹේවෙල මහතාගෙන්ද සමන්විත වූ නිල කමිටුවක් පත්කර තිබේ. මෙම නිල කමිටුව විසින් පරීක්ෂාකොට බලා නිර්දේශයන් ඉදිරිපත් කළ යුතු විෂයයන් පහතින් දැක්වේ.

(1) එක් එක් ගම්සභා සංස්ථාපණය කළ යුතු අන්දම හා එක් එක් ගම්සභාවේ වන්ද කොට්ඨාශ බෙදා වෙන් කළ යුතු ආකාරය.

(2) පාලනමය කටයුතු සම්බන්ධව පැනනැගී ඇති අවහිරතා සහ වෙනත් ගැටළු.

(3) සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට යම් බාධාවන් ඇතොත් ඒ මොනවාද?

(4) ප්‍රදේශයේ පොදු දියුණුව, පොදු අභිනිවාසිකම්., සහ වැදගත් යයි සැලකෙන වෙනත් හේතු සාධක.

ඉහතින් සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් කවර කරුණක් හෝ පිළිබඳව ලිඛිත නියෝජන ඉදිරිපත් කිරීමට කැමති සංවිධානයක්, ආයතනයක් හෝ පුද්ගලයින් වෙතොත්, ඔවුන්ගේ නියෝජන පිටපත් තුනකින් යුතුව, අවශ්‍ය නම් සිතියම්ද සහිතව (යතුරු ලියනය කරණ ලද නියෝජනයන් නම් වඩාත් යෙහෙකි.) 1973 ජූනි මස 21 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත අත්සන් කරණ අය වෙත ඉදිරිපත් කරණ ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඉහත සඳහන් කරුණු පිළිබඳව වාචිකව නියෝජන ඉදිරිපත් කිරීමට කැමති සියළුම අය එවැනි සාක්ෂි විභාග කිරීම සඳහා දින නියම කිරීමට කමිටුවට හැකි වන පරිදි ඔවුන්ගේ නම් සහ ලිපිනයන් මෙහි පහත අත්සන් කරණ අයවෙත 1973 ජූලි 21 වැනි දිනට හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කරණ ලෙසද ඉල්ලා සිටිමු.

එච්. ජී. ආනන්ද,
පරීක්ෂණ නිළකමිටුවේ සභාපති සහ පළාත් පාලන සහකාර කොමසාරිස් හම්බන්තොට.

1973 ජූනි මස 28 වැනි දා,
හම්බන්තොට,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දිය.

7-210—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් පාලන සේවයේ යතුරු ලේඛකයින්ගේ සේවයට බඳවා ගැනීමේ විභාගය (දෙමළ)—1972.10.28**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අයදුම් කරුවන් එකී තනතුරු වලට පත්කිරීම සඳහා තෝරා ගෙන ඇති බව මෙයින් දන්වනු ලැබේ:—

1. එම්. කුමාරස්වාමි—කාවාඩි උතුර—කොකුවිල්.
2. එම්. ගුණභූෂණිඅම්මා මෙනවිය—වන්තිරායන්, චැම්පියන් පත්තු.

2. මෙම අපේක්ෂකයින්ට වහාම පත්වීම් ලබා දීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට ඔවුන්ට පත්වීම් දෙනු ඇත.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973 ජූනි මස 25 වන දින,
තැ. පෙ. 530, කොළඹ.

7-16'—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

වෘත්තිය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරු ශ්‍රේණියට (සිවිල්) උසස් කිරීමේ විභාගය—1971

73.06.14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළකර ඇති ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵලවලට වැඩිදුරටත්ය. පහත නම් සඳහන් නිලධාරියාගේ ප්‍රතිඵල ද ඊට ඇතුළත් විය යුතු ය:—

| විභාග අංකය | නම | සමත්වූ විෂයය |
|---|---|---|
| 1106 | ... එම්. එස්. එම්. යූසුප් ... | මැණීම මට්ටම කිරීම 1 |

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

73. 06. 25
තැ.පෙ. 530, කොළඹ.

7-122—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

එල්. ජී.—බී. 10/68.

**කිලිනොච්චි සුළු නගර සභාව**

සුළු නගර සභා ආඥාපනත

(256 වන අධිකාරය වූ) සුළු නගර සභා ආඥාපනතේ 152 වන සහ 156 වන වගන්ති යටතේ කිලිනොච්චි සුළු නගර සභාව විසින් සාදනු ලැබ එම ආඥාපනතේ 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ජී. බී. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ජූනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

**කසළ ශෝධන සේවයට අදාළ අතුරු ව්‍යවස්ථා**

1. (අ) යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට තම ස්ථාන යට කසළ ශෝධන සේවය ලබා ගැනීමට අවශ්‍ය වූ විටක, ඔහු විසින් ඒ සඳහා ලිඛිත අයදුම්පතක් සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) සභාපති විසින්, අවශ්‍ය අවස්ථාවන්හි දී නිසි පරීක්ෂණ පැවැත්වීමෙන් පසු, මෙම අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අයදුම්පතකට ඉඩ දීම හෝ එය ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබිය හැකිය.

2. එසේ ශෝධනය කරනු ලබන එක් එක් කසළ බාල්දියකට රුපියල් දෙකයි ශත පණහ බැගින් සහ පවිත්‍ර කරනු ලබන එක් එක් ජල මුද්‍රා වැසිකිළියකට ශත පණහ බැගින් වූ කසළ ශෝධන ගාස්තුවක්, සභාව විසින් සලසනු ලැබ ඇති කසළ ශෝධන සේව යෙන් ප්‍රයෝජන ලබන යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් මාස්පතා සභාපති වෙත ගෙවිය යුතුය.

3. 2 වන අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ගාස්තුව ගෙවීමට නියමිත මාසයට පසු මාසයේ දහවැනිදා හෝ ඊට පෙර එම ගාස්තුව සභා පතියෝ කාර්යාලයේ දී හෝ එකී ගාස්තුව අයකර ගැනීමට සභාපති විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තෙකුට හෝ ගෙවිය යුතුය.

එසේ වුවද යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින්, නිශ්චිතව සඳහන් යම් සම්පූර්ණ මාසයක් තුළ ඒ ස්ථානයේ පදිංචිව නොසිටින බව සභාපති වෙත පූර්ව ලිඛිත දැන්වීමක් කරන ලද සහ අනතුරුව එකී මාසය තුළ එම ස්ථානයේ ඇත්ත වශයෙන්ම පදිංචියක් නො තිබුණු බව ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් සභාපති ඒත්තු ගන්වන ලද විටක, එම මාසය සඳහා ඒ ස්ථානය වෙනුවෙන් කසළ ශෝධන ගාස්තුවක් නො ගෙවිය යුතුය.

4. මේ අතුරු ව්‍යවස්ථා අතුරින් යම් අතුරු ව්‍යවස්ථාවක් පිළිබඳ සෑම උල්ලංඝනයක් සම්බන්ධයෙන්ම රුපියල් පනහකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවල—
"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.
"සභාව" යන්නෙන් කිලිනොච්චි සුළු නගර සභාව අදහස් වේ.

7—167—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

### ගලේවෙල සුළු නගර සභාව

සුළු නගර සභා ආඥපනත

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 129(ආ) සහ 152 වැනි වගන්ති යටතේ ගලේවෙල සුළු නගර සභාව විසින් පනවනු ලැබ, එකී ආඥපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ජී. බී. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ජූනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

#### අතුරු ව්‍යවස්ථාව

ගලේවෙල සුළු නගර සභාවේ පාලන සීමා ඇතුළත පිහිටි සෑම කුඹුරුකම සහ මිට යාකොට ඇති උපලේඛනයෙහි විස්තර කරනු ලබන ස්ථානයන් (256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 129(ආ) වැනි වගන්තිය යටතේ අය කරනු ලබන්නාවූද 1973 පෙබරවාරි මස 02 වන දින අංක 45 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1973 ජනවාරි මස 08 වැනි දින දරණ දැන්වීමෙහි සඳහන් 1973 වර්ෂය සඳහා වූ කසළ ශෝධනය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් නිදහස් කළ යුතුය.

#### උපලේඛනය

පහත දක්වෙන වරිපනම් අංක දරණ ස්ථාන :—

##### අංක 1 දරණ කොට්ඨාශය

දඹුල්ල පාර : 42/1, 42/6, 42/7, 42/12, 42/13, 66/2.

කුරුණෑගල පාර : 25, 69/5, 69/6, 69/7, 69/8, 69/8 ඒ, 69/9, 69/10, 69/14, 69/15, 77, 79, 81, 87, 93, 93/3, 101, 111, 139.

මාතලේ පාර : 87/1, 87/6, 87/7, 87/8, 93, 97, 99, 99/1, 105, 105/8, 105/10, 113, 113/8, 113/16, 113/26, 113/27, 113/36, 113/46, 119, 121, 123, 125, 131, 137, 143, 145, 149, 151, 153, 155, 157, 16, 70, 76, 84, 90, 90/5, 92, 98, 98/1, 106, 106/2, 114, 118, 118/2, 118/9, 118/10, 118/11, 118/12, 118/13, 118/14, 118/15, 118/16, 118/21, 118/31, 120, 120/1, 122, 126, 128, 130, 132, 138, 138/1, 140, 140/1, 146.

##### අංක 2 දරණ කොට්ඨාශය

දඹුල්ල පාර : 29/1, 95/1, 95/5, 95/6, 95/9, 95/10, 95/11, 95/13, 95/14, 95/15, 95/16, 95/17, 95/18 ඒ, 95/18, 95/19, 95/20, 95/21, 95/22, 95/23, 95/29, 95/30, 95/36, 95/37, 95/38, 95/39, 95/46.

ජයතිලක මාවත : 7, 9, 11, 19, 19/1, 19/3, 19/4, 29, 37, 41, 47, 47/1, 49, 57, 10/2, 10/3, 10/7, 20, 22, 22/3, 30, 32, 36, 42, 46, 46/1, 50/2.

කුරුණෑගල පාර : 56, 56/1, 58, 60, 84, 86, 90, 92, 94, 100, 102.

##### අංක 3 දරණ කොට්ඨාශය

දඹුල්ල පාර : 169/28, 169/29, 169/37, 169/46, 169/49, 169/50, 169/51, 169/52, 169/56, 169/57, 169/64, 169/67, 169/68, 193/1, 207/4,

ධර්මපාල මාවත : 57, 81, 14, 16, 20, 30, 30/1, 30/2, 30/3, 36, 38, 46, 52, 56, 60, 70, 72, 76, 82, 82/1.

##### අංක 4 දරණ කොට්ඨාශය

දඹුල්ල පාර : 281/7, 281/12, 281/15, 283/1, 285, 287/ඒ.

කලාවැව පාර : 87, 87/1, 87/9, 103, 111/1, 111/2, 111/3, 115, 121, 123, 129, 131, 133, 133/1, 133/3, 133/4, 139, 139/1, 141, 145, 149, 151, 151/1, 155, 161, 169, 171, 173, 185, 191, 12/6, 12/7, 12/8, 12/9, 12/11, 12/16, 78, 86, 94, 98, 102, 110, 114, 124.

##### අංක 5 දරණ කොට්ඨාශය

ආනන්ද රාජකරුණා මාවත : 53, 57, 59, 61, 63, 67, 71, 83, 91, 91/2, 24, 24/1, 24/2, 24/3, 26, 28, 30, 38, 40, 54, 58, 60, 60/1, 60/4, 60/10, 60/14, 70, 72, 80, සහ 82.

7–64—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

### වෙන්නප්පුව සුළු නගර සභාව

1970 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් ... ... ... | | | 56,511 88 |
| විවිධ ණය හිමියෝ ... ... | | | 72,439 07 |
| අගය අඩුවීමේ සංචිතය ... ... | | | 1,000 0 |
| අධිකතා හා ඌණතා ගිණුම (විදුලි අංශය) | | | |
| 69.12.31 වැනි දිනට අධිකතාවය ... | | 781 31 | |
| සකස් කිරීම බැර ... ... | | 4,187 35 | |
| අධිකතාවය ... ... | | 4,968 66 | |
| 70.12.31 වැනි දිනට ආදයම ... | 94,834 76 | | |
| 70.12.31 වැනි දිනට වියදම ... | 91,441 36 | 3,393 40 | |
| 70.12.31 වැනි දිනට අධිකය ... ... | | | 8,362 06 |
| | | | 1,38,313 01 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... ... ... | | | 5,439 82 |
| විවිධ ණය ගැතියෝ ... ... | | | 17,261 86 |
| දේපල බදු ... ... ... | | | 12,924 62 |
| කුලී ... ... ... | | | 1,607 55 |
| විදුලි ගාස්තු ... ... ... | | | 41,596 61 |
| වරෙන්තු ගාස්තු ... ... | | | 852 76 |
| අධිකතා හා ඌණතා ගිණුම (සාමාන්‍ය) | | | |
| 69.12.31 වැනි දිනට ඌණතාවය ... | | 8,322 32 | |
| සකස් කිරීම් (හර) ... ... | | 284 45 | |
| | | 8,606 77 | |
| 70.12.31 වැනි දිනට ආදයම ... | 62,390 21 | | |
| 70.12.31 වැනි දිනට වියදම ... | 54,383 22 | 8,006 99 | |
| ඌණතාවය ... ... ... | | | 599 78 |
| අත ඉතිරි මුදල ... ... | | | 58,030 01 |
| | | | 1,38,313 01 |

වෙන්නප්පුව සුළු නගර සභාවේ සභාපති, වර්ණකුලසූරිය කළුගමගෙ සිඩ්නි ජෝන් ප්‍රැන්සිස් ප්‍රනාන්දු වන මම, ඉහත සඳහන් 1970 දෙසැම්බර් 31 වැනි දිනට දක්වෙන වෙන්නප්පුව සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳව ප්‍රකාශය මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

1971 පෙබරවාරි මස 20 වැනි දින,
වෙන්නප්පුව සුළු නගර සභා කාර්‍යාලයේ දීය.

1971 මාර්තු මස 19 වැනි දින මා ඉදිරිපිට දුම්මලදෙනියේදී සහතික කරන ලදී.

ටී. ඇම්. ඩී. ජී. ඩබ්ලිව්. පීරිස්,
සමාදාන විනිශ්චයකාරතුමා.

නිවැරදි බව සහතික කරමි.

ජී. ඒ. රණසිංහ,
නගර සභික.

## වෙන්නප්පුව සුළු නගර සභාව

### 1970 වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය

| ආදායම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... | ... 34,393 6 | |
| බී.—මංමාවත් ... | ... 1,455 88 | |
| සී.—නගර සභා ගොඩනැගිලි හා ඉඩම් | ... 640 0 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... 25,325 27 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 3 0 | |
| ඒෆ්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... | ... 23 0 | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල | ... 550 0 | |
| | | 62,390 21 |
| **වෙනත් ආදායම්** | | |
| 1. තැන්පත්... ... | ... 38,285 49 | |
| 2. අත්තිකාරම් ... | ... 3,871 34 | |
| 3. අගය අඩුවීමේ සංචිතය ... | ... 500 0 | |
| 4. විදුලිය පිළිබඳ ගිණුම ... | ... 94,834 76 | |
| 5. විවිධ ණය ගැතියෝ ... | ... 12,954 79 | |
| 6. විවිධ ණය හිමියෝ ... | ... 30,069 99 | |
| 7. අධිකතා හා ඌණතා ගිණුම | ... 4,187 35 | |
| 8. ආදායම් රැස්කිරීමේ ගිණුම : | | |
| (ඒ) වරිපනම් ගාස්තු ... | ... 8,870 20 | |
| (බී) විදුලි ගාස්තු ... | ... 68,368 51 | |
| (සී) කුලී ... | ... 16,950 62 | |
| (ඩී) වරෙන්තු ගාස්තු ... | ... 14 57 | |
| | | 2,78,907 62 |
| 1970.01.01 වැනි දිනට මුදල් ඉතිරි ... | | 42,255 92 |
| | | 3,83,553 75 |

| වියදම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... | ... 19,539 63 | |
| බී.—මංමාවත් ... | ... 9,710 38 | |
| සී.—නගර සභා ගොඩනැගිලි හා ඉඩම් | ... 979 0 | |
| ඩී.—මහජන සෞඛ්‍යය | ... 21,810 0 | |
| අයි.—ගිනි නාශක බදුන් ... | ... 160 0 | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල | ... 2,184 21 | |
| | | 54,383 22 |
| **වෙනත් වියදම්** | | |
| 1. තැන්පත් ... ... | ... 31,908 68 | |
| 2. අත්තිකාරම් ... | ... 5,869 31 | |
| 3. විදුලිය පිළිබඳ ගිණුම ... | ... 91,441 36 | |
| 4. විවිධ ණය ගැතියෝ ... | ... 16,472 20 | |
| 5. විවිධ ණය හිමියෝ ... | ... 24,498 35 | |
| 6. අධිකතා හා ඌණතා ගිණුම | ... 284 45 | |
| 7. ආදායම් රැස්කිරීමේ ගිණුම : | | |
| (ඒ) වරිපනම් ගාස්තු ... | ... 11,733 48 | |
| (බී) විදුලි ගාස්තු ... | ... 73,371 65 | |
| (සී) කුලී ... | ... 15,216 44 | |
| (ඩී) වරෙන්තු ගාස්තු ... | ... 344 60 | |
| | | 2,71,140 52 |
| 1970.12.31 වැනි දිනට මුදල් ඉතිරි ... | | 58,030 01 |
| | | 3,83,553 75 |

වෙන්නප්පුව සුළු නගර සභාවේ සභාපති, වර්ණකුලසූරිය කළුගමගේ සිඩ්නි ජෝන් ප්‍රැන්සිස් ප්‍රනාන්දු වන මම ඉහත සඳහන් 1970 දෙසැම්බර් මස 31 වැනි දිනට දක්වෙන වෙන්නප්පුව සුළු නගර සභාවේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය, මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි හා සත්‍ය ප්‍රකාශන යක් බව මෙයින් සහතික කරමි.

1971 පෙබරවාරි මස 20 වැනි දින.
සුළු නගර සභා කායර්‍යාලය,
වෙන්නප්පුව,

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.

ජී. ඒ. රණසිංහ,
නගර සභික.

1971 මාර්තු මස 19 වැනි දින මා ඉදිරිපිට දුම්මලදෙනියේදී සහතික කරන ලදී.

ටී. ඇම්. ඩී. ජී. ඩබ්ලිව්. පීරිස්,
සමාදාන විනිශ්චයකාරතුමා.

7-21/1—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

### 1971.12.31 වැනි දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

| බැරකම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් ... ... | | | 58,637 18 |
| විවිධ ණය හිමියෝ ... | | | 77,357 68 |
| අගය අඩුවීමේ සංචිතය ... | | | 2,500 0 |
| අධිකතා හා ඌණතා ගිණුම (විදුලිය) | | | |
| 70.12.31 වැනි දිනට අධිකතාවය ... | | 8,362 06 | |
| 71.21.31 වැනි දිනට ආදායම... | 1,05,646 75 | | |
| 71.21.31 වැනි දිනට වියදම | 94,407 45 | | |
| | | 11,239 30 | |
| 71.23.01 වැනි දිනට අධිකතාවය ... | | | 19,601 36 |
| අධිකතා හා ඌණතා ගිණුම (සාමාන්‍ය) | | | |
| 70.12.31 වැනි දිනට ඌණතාවය ... | | 599 78 | |
| සකස් කිරීම් බැර ... | | 1,188 99 | |
| | | 589 21 | |
| 71.12.31 වැනි දිනට ආදායම... | 67,233 91 | | |
| 71.12.31 වැනි දිනට වියදම | 60,193 03 | | |
| | | 7,040 88 | |
| 71.21.31 වැනි දිනට අධිකතාවය ... | | | 7,630 09 |
| | | | 1,65,726 31 |

| වත්කම් | රු. ශ. |
|---|---|
| අත්තිකාරම් ... ... ... | 3,103 25 |
| විවිධ ණය ගැතියෝ ... ... ... | 18,101 14 |
| දේපල බදු ... ... ... | 17,051 45 |
| කුලී ... ... ... ... | 1,183 35 |
| විදුලි ගාස්තු ... ... ... | 28,901 09 |
| වරෙන්තු ගාස්තු ... ... ... | 1,328 44 |
| ස්ථාවර තැන්පත් මුදල ... ... ... | 30,000 0 |
| 71.21.31 වැනි දිනට අත ඉතිරි මුදල ... ... | 66,057 59 |
| | 1,65,726 31 |

වෙන්නප්පුව සුළු නගර සභාවේ සභාපති වර්ණකුලසූරිය කළුගමගේ සිඩ්නි ජෝන් ප්‍රැන්සිස් ප්‍රනාන්දු වන මම, ඉහත සඳහන් 1971 දෙසැම්බර් මස 31 වැනි දිනට දක්වෙන වෙන්නප්පුව සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳව ප්‍රකාශය මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

1972 මාර්තු මස 4 වැනි දින,
වෙන්නප්පුව සුළු නගර සභා කාර්යාලයේදීය.

නිවැරදි බවට සහතික කරමි.

කේ. අයිවන් ප්‍රනාන්දු,
නගර සභික.

1972 අප්‍රේල් මස 8 වැනි දින මා ඉදිරිපිට දුම්මලදෙනියේදී සහතික කරන ලදී.

ටී. ඇම්. ඩී. ජී. ඩබ්ලිව්. පීරිස්,
සමාදාන විනිශ්චයකාරතුමා.

## වෙන්නප්පුව සුළු නගර සභාව

### 1971 වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය

**ආදායම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... | ... 37,591 81 | |
| බී.—මංමාවත් ... | ... 1,481 08 | |
| සී.—නගර සභා ගොඩනැගිලි හා ඉඩම් | ... 9,245 83 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... 18,336 69 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 6 00 | |
| ජී.—බල්ලන් ලියාපදිංචි කිරීම ... | ... 22 50 | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල | ... 550 0 | |
| | | 67,233 91 |
| වෙනත් ආදායම් : | | |
| 1. තැන්පත්... ... | ... 39,045 56 | |
| 2. අත්තිකාරම් ... | ... 5,997 02 | |
| 3. විදුලිය පිළිබඳ ගිණුම ... | 1,05,646 75 | |
| 4. අගය අඩුවීමේ සංචිතය ... | ... 1,500 0 | |
| 5. විවිධ ණය ගැතියෝ ... | ... 14,149 70 | |
| 6. විවිධ ණය හිමියෝ ... | ... 37,431 33 | |
| 7. අධිකතා හා ඌණතා ගිණුම | ... 1,188 99 | |
| 8. ආදායම් රැස්කිරීමේ ගිණුම්— | | |
| (ඒ) වරිපනම් ගාස්තු ... | ... 8,237 44 | |
| (බී) විදුලි ගාස්තු ... | ... 93,429 50 | |
| (සී) කුලී ... | ... 18,026 44 | |
| (ඩී) වරෙන්තු ගාස්තු ... | ... 48 39 | |
| | | 3,24,701 12 |
| 1971.1.1 වැනි දිනට ඉතිරි මුදල | ... | 58,030 01 |
| | | 4,49,965 04 |

**වියදම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... | ... 21,262 72 | |
| බී.—මංමාවත් ... | ... 10,096 97 | |
| සී.—නගර සභා ගොඩනැගිලි හා ඉඩම් | ... 1,462 63 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... 24,130 94 | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල | ... 3,239 77 | |
| | | 60,193 03 |
| වෙනත් වියදම් : | | |
| 1. තැන්පත් ... ... | ... 36,920 26 | |
| 2. අත්තිකාරම් ... | ... 3,660 45 | |
| 3. විදුලිය පිළිබඳ ගිණුම ... | ... 94,407 45 | |
| 4. ස්ථිර තැන්පත් ගිණුම ... | ... 30,000 0 | |
| 5. විවිධ ණය ගැතියෝ ... | ... 14,988 98 | |
| 6. විවිධ ණය හිමියෝ ... | ... 32,512 72 | |
| 7. ආදායම් රැස්කිරීමේ ගිණුම්— | | |
| (ඒ) වරිපනම් ගාස්තු ... | ... 12,364 27 | |
| (බී) විදුලි ගාස්තු ... | ... 80,733 98 | |
| (සී) කුලී ... | ... 17,602 24 | |
| (ඩී) වරෙන්තු ගාස්තු ... | ... 524 07 | |
| | | 3,23,714 42 |
| 1971.12.31 වැනි දිනට ඉතිරි මුදල | ... | 66,057 59 |
| | | 4,49,965 04 |

වෙන්නප්පුව සුළු නගර සභාවේ සභාපති වර්ණකුලසූරිය කළුගමගේ සිඩ්නි ජෝන් ප්‍රැන්සිස් ප්‍රනාන්දු වන මම, ඉහත සඳහන් 1971 දෙසැම්බර් මස 31 වැනි දිනට දක්වෙන වෙන්නප්පුව සුළු නගර සභාවේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි හා සත්‍ය ප්‍රකාශනයක් බව මෙයින් සහතික කරමි.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

1972 පෙබරවාරි මස 4 වැනි දින,
වෙන්නප්පුව සුළු නගර සභා කාර්යාලයේදීය.

නිවැරදි බවට සහතික කරමි.

කේ. අයිවන් ප්‍රනාන්දු,
නගර සභික.

1972 අප්‍රේල් මස 8 වැනි දින මා ඉදිරිපිට දුම්මලදෙනියේදී සහතික කරන ලදී.

ටී. ඇම්. ඩී. ජී. ඩබ්ලිව්. පීරිස්,
සමාදාන විනිශ්චයකාරතුමා.

7-21/2—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

### 1972 වර්ෂයේ මොරටුව නගර සභාවේ විදුලිය අංශයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනයයි

**ආදායම්**

| | රු. ශ. |
|---|---|
| ජේ.—(1) විදුලිය විකිණීමෙන් ... ... | 14,10,805 47 |
| (2) මීටර් ගාස්තු ... ... | 9,759 0 |
| (3) පාරිභෝගික සේවා ... ... | 1,28,667 58 |
| (4) විවිධ ... ... ... | 9,375 49 |
| (6) ජීවනාධාර ... ... | 85,938 20 |
| (8) අතුරු දීමනා ... ... | 14,252 80 |
| එකතුව ... | 16,58,798 54 |

**වියදම්**

| | රු. ශ. |
|---|---|
| ජේ.—(1) විදුලිය නිපදවීම ... ... | 1,66,057 91 |
| (2) අළුත්වැඩියා හා නඩත්තු ... ... | 7,214 18 |
| (3) නිවාස සම්බන්ධතා ... ... | 18,009 05 |
| (4) පරිපාලනය හා සාමාන්‍ය ... ... | 2,92,587 26 |
| (5) ණය ගෙවීම් ... ... | 18,115 15 |
| (6) දීර්ඝ කිරීම් හා වැඩිදියුණු කිරීම් ... | 58,445 35 |
| (7) ක්ෂය ප්‍රමාණ සංචිතය ... ... | 5,000 0 |
| (8) ආපසු ගෙවීම් ... ... | — |
| (9) අතුරු දීමනා ... ... | 6,960 07 |
| එකතුව ... | 5,72,388 97 |

| වෙනත් ලැබීම් | රු. | ශ. | වෙනත් ගෙවීම් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| තැන්පත් | 1,80,852 | 17 | තැන්පත් | 1,33,763 | 83 |
| අත්තිකාරම් | 77,775 | 28 | අත්තිකාරම් | 1,22,872 | 40 |
| විදුලි ගාස්තු | 12,88,027 | 16 | ගබඩා අත්තිකාරම් | 1,57,932 | 77 |
| විදුලි මණ්ඩල බිල්පත් | 6,82,521 | 23 | ලංකා විදුලි බල මණ්ඩලය | 8,56,565 | 64 |
| ක්ෂය සංචිතය | 5,000 | 0 | අධිකතා හා ඌණතා ගිණුම | 6,31,540 | 76 |
| අධිකතා හා ඌණතා ගිණුම | 34,849 | 41 | විවිධ ණය හිමියෝ | 10,906 | 45 |
| විවිධ ණය හිමියෝ | 32,598 | 94 | දීර්ඝකාලීන ණය | 11,971 | 48 |
| විවිධ ණය ගැතියෝ | 3,019 | 53 | විවිධ ණය ගැතියෝ | 28,787 | 46 |
| ගබඩා අත්තිකාරම් ගිණුම | 50,058 | 15 | විදුලි ගාස්තු එකතු කිරීමේ ගිණුම | 14,20,564 | 47 |
| මුළු එකතුව | 39,59,500 | 41 | මුළු එකතුව | 39,47,294 | 23 |

නගර සභා ආඥා පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව 1972 වර්ෂයේ දී මොරටුව නගර සභාවේ විදුලි අංශය වෙනුවෙන් එකතු කළ ආදයම් හා කරන ලද වියදම් දක්වෙන ඉහත සඳහන් ලේඛනය මොරටුව නගර සභාවේ සභාපති, ජයසුමන ධර්මබන්ද්‍ර වන මම මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

ජයසුමන ධර්මබන්ද්‍ර,
සභාපති,
නගර සභාව, මොරටුව.

නිවැරදි බවට සහතික කරමි.

ඩබ්. එල්. එම්. ප්‍රනාන්දු,
මොරටුව නගර සභා නියෝජිත.

මොරටුවේදී මා ඉදිරිපිට දී දිවුරා අත්සන් කරන ලදී.

බී. එස්. ප්‍රනාන්දු,
සමාදාන විනිශ්චයකාර තැන.

## 1972 වර්ෂයේ මොරටුව නගර සභාවේ ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනයයි

(සාමාන්‍ය අංශය)

| ආදයම් | රු. | ශ. | වියදම් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම | 20,02,782 | 23 | ඒ.—සාමාන්‍ය වියදම් | 3,79,332 | 15 |
| බී.—මහා මාර්ග | 18,320 | 37 | බී.—මහා මාර්ග | 5,89,999 | 06 |
| සී.—තානායම් | 20,250 | 77 | සී.—තානායම් | 12,216 | 12 |
| ඩී.—සභා සතු ගොඩනැගිලි හා ඉඩම් | 38,090 | 51 | ඩී.—සභා සතු ගොඩනැගිලි හා ඉඩම් | 1,42,526 | 29 |
| ඊ.—මහජන සෞඛ්‍ය | 5,36,476 | 18 | ඊ.—මහජන සෞඛ්‍ය | 7,36,225 | 40 |
| ඇප්.—මහජන විනෝදය | 72,527 | 06 | ඇප්.—මහජන විනෝදය | 19,618 | 90 |
| ජී.—සුසාන භූමි | 3,915 | 0 | ජී.—සුසාන භූමි | 9,476 | 37 |
| එච්.—බල්ලන් ලියා පදිංචි කිරීම | 262 | 75 | එච්.—බල්ලන් ලියා පදිංචි කිරීම | 2,097 | 76 |
| අයි.—කිරුම් හා මිණුම් ගාස්තු | 2,527 | 80 | අයි.—කිරුම් හා මිනුම් ගාස්තු | 514 | 55 |
| ඇම්.—මහජන පුස්තකාල | 1,080 | 10 | ඇම්.—මහජන පුස්තකාල | 38,748 | 15 |
| එකතුව | 26,96,232 | 77 | එකතුව | 19,30,754 | 75 |

| වෙනත් අය : | රු. | ශ. | වෙනත් වියදම් : | රු. | ශ. |
|---|---|---|---|---|---|
| තැන්පත් | 2,70,615 | 95 | තැන්පත් | 2,43,178 | 85 |
| අත්තිකාරම් | 2,28,285 | 17 | අත්තිකාරම් | 2,04,182 | 32 |
| දේපල බදු (ඒ) 1 | 5,31,091 | 45 | ගබඩා අත්තිකාරම් | 3,32,026 | 13 |
| කුලී (ඩී) 1 | 30,669 | 0 | කුලී එකතු කිරීමේ ගිණුම :— | | |
| කුලී (ඊ) 7ඒ | 5,381 | 50 | (ඒ) 1 (1972) | 35,121 | 84 |
| කුලී (ඊ) 7බී | 21,417 | 50 | (ඊ) 7ඒ (1972) | 5,580 | 0 |
| ජල සේවා සම්බන්ධතා— | | | (ඊ) 7බී (1972) | 21,840 | 0 |
| ගාස්තු (ඊ) 5 එප් | 66,961 | 20 | වරිපනම් බදු එකතු කිරීමේ ගිණුම | 11,08,299 | 77 |
| කරාම ගාස්තු (ඊ) 5ඊ | 7,436 | 58 | විවිධ ණය හිමියෝ | 54,712 | 87 |
| පුද්ගලික ජල සේවා ගාස්තු (ඊ) 5බී | 1,54,734 | 93 | අධිකතා හා ඌණතා ගිණුම | 24,13,460 | 31 |
| ජලබදු (ඊ) 5ඒ | 75,880 | 0 | ධීවර ආධාර—පාරවල් | 4,784 | 0 |
| වරෙන්තු ගාස්තු (ඒ) 15 | 23,361 | 74 | මාතෘ ආධාර | 2,500 | 0 |
| විවිධ ණය ගැතියෝ | 1,430 | 0 | පුද්ගලික ජල සේවා සැපයුම්—(ඊ) 5බී | 2,42,486 | 68 |
| ජල සම්පාදක ණය වාරික | 9,81,000 | 0 | ජල කරාම ගාස්තු (ඊ) 5ඊ | 8,332 | 0 |
| ධීවර ආධාර | 9,016 | 0 | ජල සේවා සම්බන්ධතා ගාස්තු—(ඊ) 5එප් | 28,581 | 52 |
| අධිකතා හා ඌණතා ගිණුම | 73,716 | 94 | වරෙන්තු ගාස්තු එකතු කිරීමේ ගිණුම | 20,000 | 0 |
| ගබඩා අත්තිකාරම් ගිණුම | 1,43,649 | 03 | විවිධ ණය ගැතියෝ 1971 | 2,122 | 73 |
| බරවාරෝග ආධාර | 11,152 | 0 | එම 1972 | 4,76,959 | 13 |
| ස්ථිර තැන්පත් | 2,000 | 0 | ජල සම්පාදන ණය වාරික | 38,444 | 47 |
| විවිධ ණය හිමියෝ | 10,91,510 | 14 | දීර්ඝ කාලීන ණය | 1,09,850 | 0 |
| ජල බිල්පත් ගාස්තු | 6,76,375 | 55 | සේවිංස් බැංකු තැන්පත් | 710 | 62 |
| මුළු එකතුව | 71,01,817 | 45 | මුළු එකතුව | 72,83,927 | 99 |

නගර සභා ආඥා පනතේ මා වෙත පැවරී ඇති බලතල අනුව 1972 වර්ෂයේදී මොරටුව නගර සභාවේ සාමාන්‍ය අංශය වෙනුවෙන් එකතු කළ ආදායම් හා කරන ලද වියදම් දක්වෙන ඉහත සඳහන් ලේඛනය මොරටුව නගර සභාවේ සභාපති ජයසුමන ධර්මබන්ධු වන මම මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

ජයසුමන ධර්මබන්ධු,
සභාපති,
නගර සභාව, මොරටුව.

නිවැරදි බවට සහතික කරමි.
ඩබ්. එල්. එම්. ප්‍රනාන්දු,
මොරටුව නගර සභා නියෝජිත.

මොරටුවේ දී මා ඉදිරිපිට දී දිවුරා අත්සන් කරන ලදී.
බී. එස්. ප්‍රනාන්දු,
සමාදාන විනිශ්චයකාර තැන.

**වර්ෂ 1972 ක්වූ දෙසැම්බර් මස 31 වෙනි දිනට මොරටුව නගර සභාවේ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශනය**

| වගකීම් | සාමාන්‍ය | විදුලිය | එකතුව | වත්කම් | සාමාන්‍ය | විදුලිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ප්‍රාග්ධනය ... | 3,58,747 94 | 49,780 70 | 4,08,528 64 | අතිරික්ත වත්කම් :— | | | |
| දීර්ඝකාලීන ණය ... | 34,06,865 0 | 1,02,741 99 | 35,09,606 99 | මෝටර් රථ වාහන ... | 1,96,500 0 | 40,000 0 | 2,36,500 0 |
| ජල සැපයුම් ගාස්තු හිඟ ... | 27,19,717 95 | — | 27,19,717 96 | කාර්යාල උපකරණ ... | 1,62,247 94 | 9,780 70 | 1,72,028 64 |
| ණය වාරික හිඟ (ජලය)... | 10,51,492 45 | — | 10,51,492 45 | ණය සංවර්ධක ක්‍රම ... | 34,06,865 0 | 1,02,741 99 | 35,09,606 99 |
| ලංකා විදුලි බල මණ්ඩලය | — | 9,53,880 62 | 9,53,880 62 | සංසරණ වත්කම් :— | | | |
| විවිධ ණය හිමියෝ ... | 10,91,510 14 | 32,598 94 | 11,24,109 08 | වරිපනම් බදු හිඟ ... | 12,53,066 07 | — | 12,53,066 07 |
| තැන්පත් ... | 51,842 35 | 5,47,088 34 | 10,65,930 69 | කුලී හිඟ ... | 44,178 87 | — | 44,178 87 |
| රජයේ ආධාර — | | | | ජල සේවා ගාස්තු හිඟ | | | |
| පුස්තකාල සංවර්ධනය ... | 227 95 | — | 227 95 | ඊ 5 එප් ... | — | — | — |
| කානු ඉදිකිරීම ... | 2,74,935 12 | — | 2,74,935 12 | ජලකරාම ගාස්තු ඊ5ඊ ... | 7,921 42 | — | 7,921 42 |
| ප්‍රජාමණ්ඩල ... | 22 0 | — | 22 0 | මීටර් කළ ජල සේවා | | | |
| ධීවර නිවාස, කොරළවැල්ල | 58 22 | — | 58 22 | ඊ5 බී ... | 1,86,534 41 | — | 1,86,534 41 |
| ළමා මධ්‍යස්ථාන ... | 8,162 34 | — | 8,162 34 | ජල බදු හිඟ ඊ5ජ් ... | 1,68,113 0 | — | 1,68,113 0 |
| නානායම් සංවර්ධන | 521 23 | — | 521 23 | වරෙන්තු ගාස්තු හිඟ ඒ15 | 76,033 32 | — | 76,033 32 |
| ධීවර පාරවල් ... | 8,232 0 | — | 8,232 0 | විදුලි ගාස්තු හිඟ ... | — | 4,47,025 18 | 4,47,025 18 |
| මතුපිට කානු ක්‍රමය ... | 25,495 92 | — | 25,495 92 | විවිධ ණයගැතියෝ ... | 4,79,081 86 | 28,787 46 | 5,07,869 32 |
| වැය නොකළ ණය — | | | | ගබඩා අත්තිකාරම් ගිණුම | 2,87,832 72 | 1,62,005 82 | 4,49,838 54 |
| පුස්තකාල ... | 16 20 | — | 16 20 | අත්තිකාරම් ගිණුම ... | 37,98,987 96 | 2,45,097 12 | 40,44,085 08 |
| ජල සම්පාදන ක්‍රමය ... | 34,12,315 0 | — | 34,12,315 0 0 | ස්ථිර තැන්පත් ... | 2,50,595 92 | — | 2,50,595 92 |
| සුසාන භූමිය—විල්ලෝරා | | | | සේවිංස් බැංකු තැන්පත් | 4,055 76 | — | 4,055 76 |
| වත්ත ... | 9,002 14 | — | 9,002 14 | ඌණතා ගිණුම ... | 25,46,656 98 | 6,61,970 57 | 3,20,627 55 |
| විදුලි ක්‍රමය ... | — | 1,473 17 | 1,473 17 | මුදල් ... | 17,071 15 | 74,565 32 | 91,636 47 |
| මංමාවත් ... | 77 98 | — | 77 98 | මුදල් ... | 499 55 | — | 499 55 |
| ක්ෂය ප්‍රමාණ සංචිතය ... | — | 84,410 40 | 84,410 40 | | | | |
| | 1,28,86,241 92 | 17,71,974 16 | 1,46,58,216 09 | | 1,28,86,241 93 | 17,71,974 16 | 1,46,58,216 09 |

1972 දෙසැම්බර් මස 31 වැනි දිනට මොරටුව නගර සභාවේ වත්කම් හා වගකීම් දක්වෙන ඉහත සඳහන් ලේඛනය මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි හා සත්‍ය බවට මොරටුව නගර සභාවේ සභාපති ජයසුමන ධර්මබන්ධු වන මම දිවුරා සහතික කරමි.

ජයසුමන ධර්මබන්ධු,
සභාපති, මොරටුව නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.
ඩබ්. එල්. එම්. ප්‍රනාන්දු,
මොරටුව නගර සභා නියෝජිත.

මා ඉදිරිපිට දිවුරා අත්සන් කරන ලදී.
බී. එස්. ප්‍රනාන්දු,
සමාදාන විනිශ්චයකාර තැන.

7-4—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

# අය - වැය ලේඛන

**නාරම්මල සුළු නගර සභාව**

1973 අය-වැය ලේඛනය

**1973 වර්ෂයේ පළමුවැනි පරිපූරක අය-වැය ලේඛනය**

1 වැනි කොටස—සාමාන්‍ය

| ආදායම් ශිර්ෂය | රු. ශ. | වියදම් ශිර්ෂය | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම් :— | | ඒ.—සාමාන්‍ය වියදම් :— | |
| (1) වරිපනම් බදු ... ... ... | 8,000 0 | (එෆ්) විශ්‍රාම වැටුප් ... ... ... | 500 0 |
| | | බී.—මහජන සෞඛ්‍යය :— | |
| | | (2) කසළ ශෝධනය :— | |
| | | (බී) ගොන්, කරත්ත සහ ලොරි ... ... | 7,500 0 |
| | 8,000 0 | | 8,000 0 |

1973 අප්‍රේල් මස 28 වැනි දින පවත්වන ලද නාරම්මල සුළු නගර සභාවේ මාසික රැස්වීමේ අංක 5 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

එස්. එම්. බී. කේ. සුබසිංහ,
සභාපති,
නාරම්මල සුළු නගර සභාව.

1973 මැයි මස 14 වැනි දින,
නාරම්මල, සුළු නගර සභා කාර්‍යාලයේ දී ය.

අනුමත කරන ලදී.

එච්. ඇම්. එච්. බණ්ඩා,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කුරුණෑගල.

1973 ජූනි මස 22 වැනි දින,
කුරුණෑගල, සහකාර පළාත් පාලන කාර්‍යාලයේ දීය.

7-46—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

වත්තේගම නගරය

මු. රෙ. 12 (i) යටතේ 3 වෙනි අතිරේක ඇස්තමේන්තුව

මෙහි පහත සඳහන් අතිරේක ඇස්තමේන්තුව ලබාගැනීමට තීරණය කල බව මහජනයා වෙත මෙයින් දනුම්දෙනු ලැබේ.

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | | අවශ්‍ය මුදල් රු. | ශ. | | තීරණ අංකය |
|---|---|---|---|---|---|
| බී.—13 පාරවල් අළුත් වැඩ | ... | ... 1,000 | 0 | ... | අංක 121 හා 29.05.73 |
| ඒ.—2(ඇප්) කාර්යාල වියදම් | ... | ... 1,500 | 0 | ... | අංක 128 හා 18.06.73 |
| ඒ.—1(ඊ) විශ්‍රාම වැටුප් | ... | ... 1,360 | 0 | ... | අංක 129 හා 20.06.73 |
| **විදුලිය අය-වැය ලේඛනය** | | | | | |
| 3(ඇප්) නිල ඇඳුම් දීමනා | ... | ... 155 | 0 | ... | අංක 125 හා 12.06.73 |
| 3(එච්) විශ්‍රාම වැටුප් දීමනා ආදිය | ... | ... 170 | 0 | ... | අංක 129 හා 20.06.73 |

ඇස්. බී. දෙළපිහිල්ල,
විශේෂ කොමසාරිස්,
වත්තේගම නගරය.

1973 ජූනි මස 26 වැනි දින,
වත්තේගම විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

7-187—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

තිස්සමහාරාම නගරය

මුදල් රෙගුලාසි 40 (ii) යටතේ අය වැය මාරුව

අයවැය ලේඛණය—1973 (සාමාන්‍ය අංශය)

| මුදල් ඉතිරි වන වැය ශීර්ෂය | රු. | ශ. | මුදල් අවශ්‍ය වන වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—4 ... ... | 750 | 0 | ඒ.—1 (එච්) ... ... | 400 | 0 |
| බී.—2 ... ... | 2,000 | 0 | ඒ.—2 (බී) ... ... | 2,000 | 0 |
| බී.—12 ... ... | 850 | 0 | ඒ.—2 (ඩී) ... ... | 350 | 0 |
| සී.—4 ... ... | 2,000 | 0 | ඒ.—2 (ඊ) ... ... | 1,500 | 0 |
| ඩී.—3(සී) ... ... | 1,000 | 0 | ඒ.—2(එම්) ... ... | 250 | 0 |
| ජේ.—5 ... ... | 1,000 | 0 | ඩී.—1(ඩී) ... ... | 100 | 0 |
| | | | ඩී.—5 (බී) ... ... | 3,000 | 0 |
| | 7,600 | 0 | | 7,600 | 0 |
| **විදුලි අංශය** | | | | | |
| ඊඩී.—16 ... ... | 1,000 | 0 | ඊඩී.—3 (ඊ) ... ... | 600 | 0 |
| | | | ඊඩී.—3 (ජේ) ... ... | 300 | 0 |
| | | | ඊඩී—3 (කේ) ... ... | 100 | 0 |
| | 1,000 | 0 | | 1,000 | 0 |

1973 මැයි මස 25 වැනි දින තීරණ අංක 42 යටතේ අනුමත කරණ ලදී.

එච්. ජී. ආනන්ද,
විශේෂ කොමසාරිස්,
තිස්සමහාරාම නගරය.

1973 මැයි මස 31 වන දින,
තිස්සමහාරාම,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

අනුමත කරමි.

එච්. ජී. ආනන්ද,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට.

1973 ජූනි මස 21 වැනි දින,
හම්බන්තොට,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දීය.

7-179—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

හෝමාගම සුළු නගර සභාව

1973 වර්ෂයේ 1 වැනි පරිපූරක අයවැය ලේඛණය

| වැය ශීර්ෂය | ගණන් බලන ලද වියදම |
|---|---|
| | රු. ශ. |
| ඒ.—1(එෆ්) විශ්‍රාම වැටුප් ... ... | 500 0 |

1973 මැයි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමේ අංක 10 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

විල්ෆ්‍රඩ් සේනානායක,
හෝමාගම සුළු නගර සභාවේ සභාපති.

1973 මැයි මස 30 වැනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලයේදිය.

7—171—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

මතුගම සුළු නගර සභාව

සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ අයදුම් පත්‍රය

**1973 අය වැය ලේඛණය**

1973 වර්ෂයේ වැය සම්මතයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත සඳහන් මුදල් අනාය වැය සම්මතයන්හි අනුරූප අතිරේක වැය පියවා ගැනීම සඳහා පහත දක්වා ඇති පරිදි යෙදවීමට 1973.4.24 වැනි දින පැවැත්වූ මහා සභා රැස්වීමේ සම්මුති අංක (6) යටතේ සම්මත විය.

| මුදල් ඉතිරි වැය සී. | රු. ශ. | මුදල් අවශ්‍ය වැය සිරස් | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—2. (කේ) කාර්‍යාල උපකරණ ... ... | 3,037 0 | ඒ.—2. (එෆ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණය ප්‍රකාශන හා මුද්දර ... | 3,000 0 |
| | | ඒ.—2. (එල්) නිළ ඇඳුම් ... ... | 37 0 |
| | 3,037 0 | | 3,037 0 |

එස්. පස්කුවල්,
සභාපති,
මතුගම සුළු නගර සභාව.

1973 මැයි මස 31 වැනි දින,
මතුගම සුළු නගර සභා කාර්‍යාලයේ දී ය.

7–163—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

දෙව්නුවර නගරය

සිව් අවුරුදු සංවර්ධන සැළැස්ම

| රජයේ ආධාර—කර්මාන්ත | රු. ශ. | පොදු අරමුදල්—කර්මාන්ත | රු. ශ. | ණය මුදල්—කර්මාන්ත | රු. ශ. |
|---|---|---|---|---|---|
| **1973 වර්ෂය :** | | | | | |
| 1. පැතිකාණු තැනීම ... | 1,000 0 | 1. පැතිකාණු තැනීම ... | 2,000 0 | | |
| 2. දේවගේ පාර වැඩිදියුණු කිරීම ... | 1,350 0 | 2. පොදු ළිං තැනීම ... | 1,000 0 | | |
| 3. වාඩියාපාර වැඩිදියුණු කිරීම ... | 4,650 0 | | | | |
| 4. ගල්ගණේ පාර වැඩිදියුණු කිරීම | 4,000 0 | | | | |
| | 11,000 0 | | 3,000 0 | | |
| **1974 වර්ෂය :** | | | | | |
| 1. පැතිකාණු තැනීම ... | 1,000 0 | 1. පැතිකාණු තැනීම ... | 1,000 0 | 1. කාර්‍යාලීය සහ වෙනත් ගොඩනැගිළි තැනීම සඳහා ඉඩම් ලබාගැනීම ... | 2,00,000 0 |
| 2. මාර්කට් පටුමග වැඩිදියුණු කිරීම | 3,500 0 | 2. පොදු ළිං තැනීම ... | 2,000 0 | | |
| 3. වෙලේගොඩ පටුමග ඉතිරි කොටස ... | 4,500 0 | | | | |
| 4. මඩන්වැල්ල පටුමග වැඩිදියුණු කිරීම ... ... | 2,000 0 | | | | |
| 5. බණ්ඩාරවත්ත නිවාස යෝජනා ක්‍රමය—තෙවන පියවර ... | 50,000 0 | | | | |
| | 61,000 0 | | 3,000 0 | | 2,00,000 0 |
| **1975 වර්ෂය :** | | | | | |
| 1. පැතිකාණු තැනීම ... | 1,000 0 | 1. පැතිකාණු තැනීම ... | 1,000 0 | 1. කාර්‍යාලීය සහ වෙනත් ගොඩනැගිළි තැනීම ... | 1,00,000 0 |
| 2. අංගහවත්ත පාර තැනීම ... | 1,000 0 | 2. පොදු ළිං තැනීම ... | 2,000 0 | | |
| 3. සැන්ඩිස් පටුමග තැනීම ... | 5,000 0 | | | | |
| 4. වාඩියා පටුමග තැනීම ... | 4,000 0 | | | | |
| | 11,000 0 | | 3,000 0 | | 1,00,000 0 |
| **1976 වර්ෂය :** | | | | | |
| 1. පැතිකාණු තැනීම ... | 1,000 0 | 1. පැතිකාණු තැනීම ... | 1,000 0 | | |
| 2. සුසානභූමි පාර තැනීම ... | 4,000 0 | 2. පොදු ළිං තැනීම ... | 2,000 0 | | |
| 3. හුම්මාන පාර තැනීම ... | 3,000 0 | | | | |
| 4. විමලජෝති පටුමග තැනීම ... | 3,000 0 | | | | |
| | 11,000 0 | | 3,000 0 | | |

1973 ජූනි මස 13 දින අංක 335 දරණ තීරණයෙන් පිළිගත් බවට,

පී. බී. විල්සන්,
විශේෂ කොමසාරිස්, දෙව්නුවර නගරය.

1973 ජූනි මස 13 වැනි දින,
දෙව්නුවර විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දී ය.

7-44—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

### මොනරාගල විශේෂ කොමසාරිස් කාර්යාලය

පළමුවැනි අතිරේක අයවැය ලේඛණය
**විදුලිය 1973**

**1 වන කොටස**

පුනරාවර්තන වියදම්

| වියදම් ශීර්ෂය සහ උප ශීර්ෂය | ගණන් බලන ලද වැය රු. | ශ. |
|---|---|---|
| 4.—විදුලිය බෙදහැරීම— | | |
| (එෆ්) විවිධ ගාස්තු ... ... ... | 500 | 0 |
| 5.—නඩත්තුව සහ අළුත්වැඩියා කිරීම— | | |
| (බී) මීටර් සහ අනිකුත් උපකරණ ... ... | 1,000 | 0 |
| 6.—පාරිභෝගිකයින් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත— ... | | |
| (ඒ) ද්‍රව්‍ය : | | |
| (i) නව සේවා පිරිද්දුම් ... ... | 21,500 | 0 |
| (ii) නඩත්තු කිරීම ... ... | 1,000 | 0 |
| (බී) කම්කරු ගාස්තු : | | |
| (i) තාවකාලිකව ... ... ... | 1,000 | 0 |
| එකතුව ... | 25,000 | 0 |

ඉහත විස්තර සඳහන් වැය පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයන්ට ඉඩතබා පිළිගැනීමට තීරණය කරමි.

ටී. බී. වර්සකෝන්,
විශේෂ කොමසාරිස්,
මොනරාගල නගරය.

1973 ජූනි මස 01 දින,
මොනරාගල,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

අනුමත කරමි.

ටී. බී. වර්සකෝන්,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
මොනරාගල.

1973 ජූනි මස 01 දින,
මොණරාගල,
පළාත් පාලන කාර්යාලයේ දීය.

7-214—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

### කුලියාපිටිය නගර සභාව

#### ජල භීතිකා රෝගය

කුලියාපිටිය නගර සභා සීමාව තුළ ජල භීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සභා සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන දඬුවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවෙලෙහිම විනාශ කරනු ලබන බව (476 වැනි අධිකාරය වන) ජල භීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

මෙම නිවේදනය 73. 06. 01 වැනි දින සිට 73. 12. 01 වැනි දින දක්වා වලංගුව පවතී.

කිරිබණ්ඩා සත්කුමාර,
කුලියාපිටිය නගරයේ විශේෂ කොමසාරිස්.

1973. 06. 01 වෙනි දින,
කුලියාපිටිය,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

7-161—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

### පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු-ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ පුස්සැල්ලාව නගරයේ විශේෂ කොමසාරිස් විසින් සම්මතකරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

යෝජනාව

පළාත් පාලන කටයුතු පිළිබඳ ඇමති වරයා විසින් සම්පාදනය කරනු ලද්දා වූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවකින් අනුමත කරන ලද බව 1954 මාර්තු 26 වැනි දින අංක 10,657 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයකින් ප්‍රකාශ කරන ලද්ද වූද, 1953 නොවැම්බර් 6 වැනි දින අංක 10,609 දරණ ගැසට් පත්‍රයේ පලවී ඇති පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල I සිට XIV, XVI සිට XVIII, XX, XXII, XXIII, XXV, XXVIII සහ XXIX දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කරගැනීමට පුස්සැල්ලාව නගරයේ විශේෂ කොමසාරිස් විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

එල්. ජී. ඩී. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
පුස්සැල්ලාව නගරය.

1973 ජූනි මස 22 වැනි දින,
පුස්සැල්ලාව විශේෂ කොමසාරිස් කායර්‍යාලයේදීය.

7-40—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

### හම්බන්තොට දිස්ත්‍රික්කයේ තලාව ගම් සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාව

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් මස් විකිණීමට 1973 වර්‍ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බැවින් මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව තලාව ගම් සභාව සීමාව ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ හෝ කරුණු සඳහායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවෙන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතවූ 272 වන අධිකාරයේ අංක 7 (2) දරන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඩබ්ලිව්. ඒ. ජයවර්ධන, නො. 15, ශ්‍රීපාද මාවත, රත්නපුර. | අඟුණකොළපැලැස්ස නගරය | එළු හරක් මස් |

සී. ඒකනායක,
තලාව ගම්සභාවේ සභාපති.

1973. 06. 25 දින,
තලාව ගම්සභා කාර්යාලයේ දීය,
කාරියමඩිත්ත.

7-159—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

## උඩුනුවර කඳුපළාත ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර, නියමිත බලධාරියාවූ උඩුනුවර කඳුපළාත ගම්සභාවේ සභාපති, යූ. එල්. නූර් මොහමඩ් වන මම, 1973 වර්‍ෂයේදී මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් දිනයන්හිදී උඩුනුවර කඳුපළාත ගම් සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ විකිණීම හෝ මස් ප්‍රදර්ශනය කිරීම හෝ මස්කඩ විවෘතව තැබීම හෝ මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

1973 අප්‍රේල් 17 පුර පසළොස්වක පෝය දිනය.
1973 මැයි 16, 17 (දෙදින) වෙසක් පුර පසළොස්වක පොහොය වෙනුවෙන්.
1973 ජූනි 15, පොසොන් පුර පසළොස්වක පොහෝ දිනය.
1973 ජූලි 14, ඇසළ පුර පසළොස්වක පොහොය දිනය.
1973 අගෝස්තු 13, නිකිණි පුර පසළොස්වක පොහොය දිනය.
1973 සැප්තැම්බර් 12, බිනර පුර පසළොස්වක පොහොය දිනය.
1973 සැප්තැම්බර් 26, බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය.
1973 ඔක්තෝබර් 4, ලෝක සත්ව දිනය.
1973 ඔක්තෝබර් 11, වප් පුර පසළොස්වක පොහොය දිනය.
1973 ඔක්තෝබර් 25, දීපාවලී උත්සව දිනය.
1973 නොවැම්බර් 10, ඉල් පුර පසළොස්වක පොහොය දිනය.
1973 දෙසැම්බර් 9, උඳුවප් පුර පසළොස්වක පොහොය දිනය.

යූ. එල්. නූර් මොහමඩ්,
සභාපති,
උඩුනුවර කඳුපළාත ගම්සභාව.

1973 ජූනි මස 27 දින,
වෙලම්බොඩ, ඇල්පිටිකන්ද,
උඩුනුවර කඳුපළාත ගම්සභා කාර්යාලයේදීය

7-182 —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පණත

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වන අධිකාරය) 3 වන වගන්තිය යටතේ, මාතර දිස්ත්‍රික්කයේ ගන්දර ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පලකර සිටිනු ලැබේ.

### යෝජනාව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ, වර්ෂ 1972 ක්වූ නොවැම්බර් මස 03 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පලකරනු ලැබ, ශ්‍රී ලංකා රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවල 42 වැනි කොටස මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට ගන්දර ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පණතේ (261 වැනි අධිකාරය) 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පී. ඇස්. ඇල්. ගලප්පත්ති,
ගන්දර ගම් සභාවේ ප්‍රධානතුමා.

ගම් සභා කාර්යාලය,
ගන්දර, 1973 ජූනි මස 22 දින,

7-190 —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත් එය ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවන දින සිට කෑගල්ල දිස්ත්‍රික්කයේ කඳු අහ පත්තු ගම්සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, 1973 මැයි මස 30 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 5 (4) දරණ යෝජනාවෙන් තිරණය වූ බව කඳු අහ පත්තු ගම්සභාවේ සභාපති වන ඇරැගම ඉනියා රාල්ලාගේ පිකිරි බන්ඩා වන මම මෙයින් දන්වා සිටිමි.

ඇ. ඉ. රා. පිකිරි බන්ඩා,
කඳු අහ පත්තු ගම්සභාවේ සභාපති.

1973 ජූනි මස 21 වැනි දින,
උඳුගොඩ පිහිටි,
කඳු අහ පත්තු ගම්සභා කායර්‍ාලයේදිය.

### අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වන කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථාව පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ

(1) එහි පළවැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

'1' මෙම අතුරු ව්‍යවස්ථාවල 'අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර' යන්නෙන් මෙහි වූ උප ලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ. තවද

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උප ලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

### උපලේඛනය

#### I වැනි කොටස

#### අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරලු හෝ කළුගල් කැනීම.
කබුක්, බොරළු හෝ කලුගල් ගබඩා කිරීම.
සිසිල් බීම නිෂ්පාදනය.
ග්‍රෝස් එකට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම ගබඩා කර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවලු තෙල් නිෂ්කරණය.
ගැලුම් 50 කට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩාකර තබා ගැනීම.
පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 කට වැඩි ප්‍රමාණයක ගිනි පෙට්ටි ගබඩාකර තබා ගැනීම.
ඉඹුල් පුලුන් හෝ කපු පුලුන් ගබඩාකර තබා ගැනීම.
මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
පිදුරු ගබඩාකර තබා ගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.
කුලියට දීමට ලාම්පු ගබඩා කර තබා ගැනීම.
ධාන්‍ය හෝ මාෂ බෝග වර්ග හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
අතින් ලී ඉරුම් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.
හිරිගල් හෝ හුණු ගල් සඳහා හැරීම.
දර ගබඩාවක් පවත්වාගෙන යාම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යාම.
යන්ත්‍රෝපකරන පාවිච්චි නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යාම.

තොග වශයෙන් විකිනීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩාකර තබා ගැනීම.

බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යාම.

අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

පොල්කටු ගබඩාකර තබා ගැනීම.

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොන්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර කඩදාසි හෝ ගබඩාකර තබා ගැනීම.

විසිරි පිංතාරු, ස්ප්‍රේ පේන්ටින් සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විදියකින් නූල් නැනීම හෝ විවීම.

සිල්ක් සහ කෘතීම රෙදි විවීම හා විසිතුරු කිරීම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විදිහකින් රෙදි නිපදවීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.

මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

## II වැනි කොටස

### අප්‍රසන්න ව්‍යාපාර

මිනිරම් ශුද්ධ කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පෝර හෝ රසායනික පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
හම් ගබඩාකර තබා ගැනීම.

උම්මලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොන්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්මලකඩ ගබඩාකර තබා ගැනීම.

කුකුළන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම.

බැටළුවන්, එළුවන් හෝ ඌරන් 10 කට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම.

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම.

පුවක් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

තොග වශයෙන් විකිනීම සඳහා නරක්වන සුලු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.

කරවල, ලුනු මාළු හෝ ජාඩි හොන්ඩර 3 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම.

සිමෙන්ති හොණ්ඩර 25 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම්කොල සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම.

පුන්නක්කු ටොන් 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
සත්ව ආහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම.

සබන් නිෂ්පාදනය කිරීම.

සව් හෝ මයියොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇට කටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම.

ට්‍රන්ක් පෙට්ටි සෑදීම.

අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.

ලෝහමය පුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩාකර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබා ගැනීම.

සිරප් හෝ පලතුරු බීම වර්ග සෑදීම.

රස කැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දැව පල්කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.

මේද නිපදවීම නිර්කර්ෂණය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.

දත් බුරුසු නිපදවීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

විනාකිරි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

ඇසිට් වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

හුණු ගල් හෝ හුණු ගබඩාකර තබාගැනීම.

පෑණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

පින්තාරු තීන්ත හෝ වාර්නිස් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.

සෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.

සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාෂ බෝග, කුලුබඩු හෝ පිටි ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම.

බේකින් පවුඩර් නිපදවීම.

මාජරින් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.

ඉටිපන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ පූයර නිපදවීම.

පාසැල් රටහුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසැල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩාකර තබා ගැනීම.

ශීත කල මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම.

කපාපු පොල් ගබඩාකර තබා ගැනීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දිය හුණු, සුදු (වයිටින්) හුණු හෝ හිරිගල් නිපදවීම.

එන්සාල් (කරදමුන්ගු) සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් සුද්ද කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු එන්සාල් (කරදමුංගු හෝ කෙඳි වර්ග සකස් කිරීම.

බ්‍රයික්ලීන් කරන ස්ථානයක් හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිනිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

හොණ්ඩර 5කට වැඩියෙන් තේ ගබඩාකර තබා ගැනීම.

බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

වැල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සර්විස් කිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.

බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

පොලිස් ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කව (කොයිල්ස්) නිපදවීම.

ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.

ගල් තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, ශීතකරන හෝ අධි සීතකරන (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම.

සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනින් හෝ ක්ලච් ලයිනින් නිපදවීම.

යන්ත්‍රෝපකරන නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුණු කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියලි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

රන්කම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිස්කරණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පලක් හෝ පවත්වාගෙන යාම.

7-165—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වර්ෂික**

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළු දෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... 73.06.29 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... 73.07.06 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... 73.07.13 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... 73.07.20 | සිකුරාද | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... 73.07.27 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... 73.08.03 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... 73.08.10 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... 73.08.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... 73.08.24 | සිකුරාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**1973 මැයි මස 04 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.